**1. තනතුර - උපදේශන නිලධාරී (පුනරුත්ථාපන)**

**2. වයස** - අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3. සුදුසුකම්**

**අ. බාහිර අයදුම්කරුවන්**

i. උපදේශන මනෝ විද්‍යාව/ මනෝ විද්‍යාව/ සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම හෝ මෙම තනතුරට අදාල වන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**ආ. අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් වලින් 2න් එකක් සපුරා තිබිය යුතුය.)**

i. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

ii. කළමනාකරණ සහකාර - තාක්ෂණ (MA 2-2) සේවා ගණයෙහි තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**ඇ. වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4. වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - MA 4 2025

මූලික වැටුප - රු. 58,598.00 (2026), රු. 64,320.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ

වාර්ෂික වැටුප - 58, 598.00 + 17800.00 x 12 = රු. 916,776.00 (2026)

64,320.00 + 17800.00 x 12 = රු. 985,440.00 (2027)

**5. රාජකාරී ස්වභාවය**

i. පුනරුත්ථාපනය සඳහා මධ්‍යස්ථානයන් වෙත යොමු කරනු ලබන අන්තරායකර ඖෂධ වලට ඇබ්බැහි වූ පුනරුත්ථාපන ලාභින්ගේ මානසික හා කායික තත්ත්වයන් පිළිබඳ නිවැරදි තක්සේරුවකින් පසු ඔවුන් යහ මගට ගැනීමට හා අන්තරායකර ඖෂධ සඳහා වන ඇබ්බැහිය වැලැක්වීම සඳහා සුදුසු උපදේශනයන් ලබාදීම.

ii. පුනරුත්ථාපනය වන අභ්‍යාසලාභින්ගේ ව්‍යාකූල තත්ත්වයන් විශ්ලේෂණය තුලින් පුනරුත්ථාපනලාභීන් සඳහා අවශ්‍ය වන තනි පුද්ගල හෝ කණ්ඩායම් උපදේශනයන් සැලසුම් කිරීම්.

iii. පුනරුත්ථාපනලාභින්ගේ උපදේශනයන් පිළිබඳ නිවැරදි සියලුම දත්ත හා ලිපිලේඛණ නිසි පරිදි නඩත්තු කිරීම. එම දත්ත ආශ්‍රයෙන් සතිපතා, මාසිකව ඔවුන් පිළිබඳ ඇගයීම් සිදු කිරීම හා එම දත්තයන් ආරක්ෂාකාරීව සුරැකිම.

iv. අභ්‍යාසලාභීන්ගේ මානසික හා කායික සුවය සඳහා අවැසි සුබසාධක කටයුතු පිළිබඳ අවධානය යොමු කරමින් සාර්ථක පුනරුත්ථාපනයක් සඳහා සහාය දැක්වීම.

v. පුනරුත්ථාපනලාභීන්ගේ සුබසිද්ධිය සඳහා සුදුසු වෘත්තීය ක්‍රම උපායන් හඳුනා ගැනීම හා ඒ සඳහා සුදුසු මාර්ගෝපදේශනය ලබාදීම.

vi. පුනරුත්ථාපනලාභීන්ගේ මානසික තත්ත්වය සහ අවශ්‍යතාවය පරිදි සමාජ/සංස්කෘතික/ ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

vii. සියළුම පුනරුත්ථාපනලාභීන්ගේ චර්යාවන් අධ්‍යනය කර ඔවුන් පිළිබඳව අවශ්‍ය ප්‍රගති වාර්ථා නිසි කලට ලබාදීම සහ පුනරුත්ථාපනලාභින් පිළිබඳව අවශ්‍ය සියළුම වාර්ථාවන් නිසි පරිදි නඩත්තු කිරීම.

viii. අවශ්‍යතාවය අනුව පුනරුත්ථාපනළාභීන් පිළිබඳ තොරතුරු වෛද්‍යවරුන්, මනෝ විකිත්සකයින් වැනි වෘත්තිකයින්ට උපදේශන මූලධර්මයන්ට අනුකූලව ලබා දීම.

ix. සමාජගත වන පුනරුත්ථාපනලාභින් සඳහා පවුල් උපදේශනයන් සිදු කිරීම.